# මිල, වැටුප් හා සේවා නියුක්තිය

## සමස්ත මිල වෙනස්වීම්

පසුගිය වර්ෂය හා සසඳන කළ, සමස්තයක් වශයෙන් 1992 වර්ෂයේදී මිල ගණන්හි වාර්ෂික සාමාන්‍ය වර්ධනයෙහි සුළු අඩුවීමක් පෙන්නුම් කෙරුණි. 1991 වර්ෂයේදී කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි වූ සියයට 12.2 ක වාර්ෂික වැඩිවීම හා සසඳා බලන කළ, 1992 වර්ෂයේදී එහි වූ වැඩිවීම සියයට 11.4 කි. එසේ වුවද, 1992 වර්ෂයේ අවසාන මාස වල දැකිය හැකි වූ මිල ගණන් වල තරමක ඉහළ යාම පිළිබිඹු කරමින් ලක්ෂ්‍යමය පදනම මත (1992 දෙසැම්බර් දර්ශකය, 1991 දෙසැම්බර් දර්ශකය හා සැසඳීම) වර්ෂාවසානයේ දී මිල දර්ශකයෙහි සියයට 13.8 ක වැඩිවීමක් වාර්තා වුණි. මේ හා සසඳන කළ 1991 වර්ෂය අවසානයේදී වූ වැඩිවීම සියයට 9.0 කි. මිල වැඩිවීමේ වර්ධන වේගයෙහි වූ මෙම අඩුවීම ප්‍රාථමික වෙළඳ පොලෙහි දීද දක්නට ලැබුණ බව 1991 දී සියයට 9.2 ක් වූ තොග මිල දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම 1992 දී සියයට 8.8 ක් පමණක් වීමෙන් පැහැදිලි වේ.

1991 වර්ෂයේ සිට දක්නට ලැබුන මිල වැඩිවීමේ වර්ධන වේගයෙහි වූ අඩුවීම 1992 වර්ෂයේ මුල් භාගය තුළ ද දක්නට ලැබුන අතර මෙම තත්ත්වය විශේෂයෙන්ම දක්නට ලැබුනේ වසරේ මුල් කාර්තුව තුලදීය. 1992 වසරේ මුල් කාර්තුව තුල මිල ඉහළ යාමේ ප්‍රවණතාව අඩුවීමට මුල් වූ ප්‍රධාන හේතුව වූයේ තිරිඟු පිටි, පාන් හා භූමිතෙල් වැනි මූලික භාණ්ඩවල මිළෙහි වූ ස්ථාවර බවත්, මහ කන්නයේදී සහල්, එළවළු සහ වියලි මිරිස් වැනි අත්‍යවශ්‍ය ආහාර වල සැපයුම වැඩි වීමත්ය.

1992 මැයි මාසයේ සිට මූලික භාණ්ඩවල මිළ අඩුවීමේ ප්‍රවණතාවයෙහි සුළු පසුබෑමක් දැකිය හැකි විය. මහ කන්නය අවසාන වීමත් සමඟ සාමාන්‍යයෙන් මිළ ගණන් නැවත ඉහළ යාමේ නැඹුරුවක් ඇතිවන හෙයින් මෙම වෙනස්වීම තරමක්දුරට කාලීනව සිදු වන්නකි. මැයි මාසයේදී ආරක්ෂක බද්ද සියයට 1 සිට 3 දක්වා වැඩි කිරීම හේතුකොට ගෙන සීනි, කිරිපිටි සහ බෙහෙත් වර්ග වැනි ඇතැම් අත්‍යවශ්‍ය භාණ්ඩ වල මිළ ගණන් කෙරෙහි වූ තියුණු බලපෑම මෙම ප්‍රවණතාව තවදුරටත් තීව්‍ර කිරීමට හේතු විය.

වසරේ අවසාන මාස කීපය තුළ දී මිළ ඉහළ යාමේ වාර්ෂික සාමාන්‍ය අඩුවීමේ ප්‍රවණතාවයෙහි පසුබෑමක් නැවතත් දක්නට ලැබුණි. මෙම වෙනසට මූලික හේතුව වූයේ යල කන්නයේ ආහාර බෝග නිෂ්පාදනය කෙරෙහි බලපෑ දැඩි නියඟය යි. වසරේ අවසාන මාස කිහිපය තුළ දී දක්නට ලැබුනු මෙම මූලික භාණ්ඩ වල මිළ ඉහළ යාමේ ප්‍රවණතාවයෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1992 ජූලි මාසයේදී සියයට 8.6 ක් ව පැවති පාරිභෝගික මිළ දර්ශකයේ සමස්ත වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම 1992 දෙසැම්බර් මස වන විට සියයට 11.4 දක්වා වැඩි විය.

ඉල්ලුම් අංශයෙන් සලකා බලන විට, 1992 වර්ෂයේ මුල් කාලය තුළ මූල්‍ය සමස්තයන්ගේ වර්ධන වේගයෙහි වූ වැඩිවීම ද සාමාන්‍ය මිළ මට්ටම කෙරෙහි දැඩි පීඩනයක් ඇති කළ බව පෙනේ. ද්‍රවශීලතාව පාලනය කිරීම සඳහා වෙළෙඳපල මත නැඹුරු වූ ප්‍රතිපත්ති කෙරෙහි මහ බැංකුව දැඩි විශ්වාසයක් තබමින් දැඩි මූල්‍ය ප්‍රතිපත්ති මාලාවක් වර්ෂය තුළදීම ක්‍රියාත්මක කරන ලදී. 1992 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිපත්තීන් මූලික වශයෙන් යොමු වූයේ විවට වෙළෙඳපල කටයුතු කෙරෙහිය. මෙම ප්‍රතිපත්තීන්, වර්ෂය තුළ උද්ධමනකාරී තත්ත්වය අඩු කිරීමෙහිලා උපකාරී වූ බවට කිසිදු සැකයක් නැත.

## පාරිභෝගික මිළ

1992 වර්ෂයේදී කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය වර්ධනය සියයට 11.4 ක් විය. 1991 වසරේදී වාර්තා වූ සියයට 12.2 ක වර්ධනය සමඟ

සසඳන විට වර්ෂය තුළදී මිළ ගණන් වල වර්ධන වේගයෙහි සුළු අඩුවීමක් වූ බව මෙමගින් පිළිබිඹු වේ. මිළ ගණන් වල අඩු වර්ධනයට හේතු වූයේ රෙදිපිළි සහ ඉන්ධන හා ආලෝක සඳහා වූ මිළ ගණන් වල වූ අඩු වර්ධනයකි. 1992 වර්ෂයේදී ආහාර ද්‍රව්‍ය වල මිළ ගණන්හි සමස්ත වශයෙන් වූ වැඩිවීම ඊට පෙර වසරේ වාර්තා වූ වැඩිවීමට බොහෝසෙයින් සමාන වූ අතර විවිධ භාණ්ඩවල මිළ පසුගිය වසරට වඩා ශීඝ්‍ර ලෙස වැඩි විය. වර්ෂයේ අවසාන මාස හතර තුළ දී මිළ ගණන් වල වැඩිවීමේ කැපී පෙනෙන උපනතියක් දක්නට ලැබුනි. මෙම වැඩිවීම වර්ෂයේ අවසාන මාසය තුළදී වඩාත් කැපී පෙනුන අතර, එහි ප්‍රතිඵලය වූයේ 1991 වර්ෂයේ දෙසැම්බර් වන විට සියයට 9.0 ක් ව පැවති ලක්ෂ්‍යමය පදනමක් මත වූ මිළ දර්ශකයෙහි වැඩිවීම 1992 දෙසැම්බර් වන විට සියයට 13.8 ක් වීමයි.

නිරපේක්ෂ වශයෙන් මිළ ගණන් වල වැඩිවීමක් නොකඩවා සිදු වුන ද, 1991 වසරේ සිට ආරම්භ වූ මිළ වැඩිවීමේ වේගයෙහි වූ අඩු වර්ධනය 1992 වර්ෂයේ මුල් මාස අට තුළ දීම දක්නට ලැබුනි. පාරිභෝගික මිළ ගණන් වල වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශේෂයෙන්ම වර්ෂයේ අවසාන කාලය තුළ ආහාර ද්‍රව්‍ය වල මිළ ගණන්හි වූ වැඩිවීමයි. සමස්ත වශයෙන් වූ මිළ වැඩිවීමෙන් සියයට 73 ක් ම ආහාර ද්‍රව්‍යවල මිළ වැඩිවීම නිසා සිදු වූ අතර රෙදිපිළි, ඉන්ධන හා ආලෝක සහ විවිධ භාණ්ඩ යන අංශවල දායක වීම පිළිවෙලින් සියයට 3.3, 2.7 සහ 21.0 විය.

**1.35 සංඛ්‍යා සටහන**

**කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය (1952 = 100)**

| ශීර්ෂය | සාමාන්‍ය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | සමකාලීන ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1990 වඩා 1991 | 1991 වඩා 1992 | 1990 දෙසැ. වලට වඩා 1991 දෙසැ. වල වෙනසෙහි ප්‍රතිශතය | 1991 දෙසැ. වලට වඩා 1992 දෙසැ. වල වෙනෙසෙහි ප්‍රතිශතය |
| සියලුම ශීර්ෂ භාණ්ඩ අනුව | 1131.5 | 1260.4 | 12.2 | 11.4 | 9.0 | 13.8 |
| ආහාර | 1220.3 | 1366.0 | 11.9 | 11.9 | 9.4 | 14.6 |
| රෙදිපිළි | 678.4 | 723.6 | 11.2 | 6.7 | 9.3 | 5.1 |
| ඉන්ධන හා එළිය | 2252.5 | 2334.3 | 16.5 | 3.6 | 4.9 | 3.2 |
| ගෙවල් කුලී | 109.8 | 109.8 | - | - | - | - |
| විවිධ | 1146.0 | 1318.7 | 12.2 | 15.1 | 9.7 | 19.5 |


මූලයන්: ජන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

මිළ දර්ශකයේ සියයට 61.9 ක බර තැබීමක් ඇති ආහාර උප දර්ශකය 1992 වර්ෂයේදී සියයට 11.9 කින් වර්ධනය වුනි. මෙම වැඩිවීම 1991 දී අත්දුටු වැඩි වීමට සමාන වුනද, 1992 වර්ෂයේදී එම වර්ධනයෙහි උච්ඡාවචනයන් පෙන්නුම් කෙරුණි. 1992 වර්ෂයේ මුල් මාස කීපය තුළදී ආහාර වල මිළ වැඩිවීමේ වර්ධන වේගය 1991 අදාල කාල පරිච්ඡේදය හා සලකා බලන විට සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළ ද 1992 වර්ෂයේ දෙවන කාර්තුව තුළ දී එහි වර්ධන වේගය ඉහළ මට්ටමක පැවතුණි. වර්ෂයේ පළමුවෙනි සහ තෙවෙනි කාර්තුවල මිළ ගණන්වල වැඩිවීමේ වේගය අඩුවීම කෙරෙහි කාලීන හේතුන් බලපෑ බව පෙනේ. කෙසේ වුවද, හතරවෙනි කාර්තුව වන විට මිළ ගණන් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර දෙසැම්බර් මාසය වන විට එය උපරිම මට්ටමකට පැමිණුනි. දෙසැම්බර් මාසය වන විට වර්ධන වේගයෙහි වූ මෙම වැඩිවීම හේතුකොට ගෙන 1991 දී සියයට 9.0 ව පැවති ලක්ෂ්‍යමය පදනම මත වූ මිළ වැඩිවීම 1992 දෙසැම්බර් මාසය වන විට සියයට 13.8 දක්වා

# තොග අලෙවි මිළ දර්ශකය

1974 = 100

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

වැඩි විය. 1991 වර්ෂයේ දෙසැම්බර් මාසයේ සිට 1992 වර්ෂයේ අප්‍රේල් මස දක්වා පැවති දිගු එමෙන්ම දැඩි නියඟය බොහෝ ආහාර බෝගවල නිෂ්පාදනය කෙරෙහි අහිතකාරීව බලපෑ අතර එය එම බෝගවල මිළ කෙරෙහි බලපෑවේය. යල කන්නයෙහි වී වගාව කෙරෙහි එය දැඩි බලපෑමක් ඇති කළ අතර එනිසා නිමැවුම සියයට 15 කින් පමණ පහළ වැටුනි. පෙබරවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ පහත වැටුණු සහල් මිළ එතැන් සිට ඉහළ නැඟෙන්නට වූයෙන් 1991 වර්ෂයේදී මෙන් සහල් මිළ ගණන් සැප්තැම්බර් මාසය දක්වා පහළ මට්ටමක තිබීමක් දක්නට නොලැබුනි. මේ අනුව, ආයාත වල සියයට 60 ක වැඩිවීමක් තිබියදීත්, 1992 වර්ෂය තුළ දී සහල් මිළ සියයට 11 කින් පමණ වැඩි විය. වසරේ හතරවන කාර්තුව ආරම්භ වීමත් සමඟ තිරිඟු පිටිවල පාලන මිළ අඩු කිරීම, මිල දර්ශකය කෙරෙහි බලපෑවේ ඉතා සුළු වශයෙනි. 1992 වර්ෂයේදී මුළු පොල් නිෂ්පාදනය වැඩි වුනද, ලෝක වෙළෙඳපොලෙහි පොල් තෙල් මිළ ඉහළ යාමත්, කපාපු පොල් නිර්යාත වැඩිවීමත් හේතුකොට ගෙන පොල් සහ පොල් තෙල් වල මිළ ගණන් ඉහළ මට්ටමක පැවතුනි. මීට අමතරව, නියඟයෙහි බලපෑම කිසියම් කාල පමාවකින් යුතුව නිමැවුම කෙරෙහි ඇති වූ බව වසරේ අවසාන මාස කීපය තුළ දී පොල් සඳහා වූ ඉහළ මිළ ගණන් මඟින් පිළිබිඹු විය. 1992 වර්ෂයේදී රතුළූනු, මිරිස් සහ අර්තාපල් අස්වැන්න වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය තුළ දී ඒවායේ සාමාන්‍ය මිළ ගණන් වල අඩුවීමක් වාර්තා විය. කෙසේ වුවද, මෙම අඩුවීම සටහන් වන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් එළවළු සහ මාළුවල සාමාන්‍ය මිළ ගණන් වැඩි විය. සීනි හා කිරි වැනි ආහාර වර්ග වල මිළ ගණන් වැඩි වීම ද ආහාර උප දර්ශකයේ වැඩිවීමට දායක විය.

රෙදිපිළි, ඉන්ධන හා ආලෝක සඳහා වූ උප දර්ශකයන්හි වාර්තා වූ වැඩිවීම 1992 වසරට වඩා බෙහෙවින් අඩු විය. 1992 වර්ෂයේදී රෙදිපිළි උප දර්ශකයේ වූ වැඩිවීම සියයට 6.7 ක් වූ අතර 1991 වසරේදී එහි වැඩිවීම සියයට 11.2 ක් විය. ඉන්ධන හා ආලෝක උප දර්ශකයේ වැඩිවීම සියය 3.6 පමණක් වූ අතර, 1991 වසරේදී එහි වැඩිවීම සියයට 16.5 ක් විය. වර්ෂයේ මැද භාගයේදී විදුලි ගාස්තු සඳහා ඉන්ධන ගැලපුම් ගාස්තු වශයෙන් අමතර අයකිරීමක් හඳුන්වා දෙනු ලැබුවද, එය කිසියම් අවම ප්‍රමාණයකට විදුලිය පරිභෝජනය කරන්නන් සඳහා බලපැවැත්වූයේ නැත. කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය මඟින් අඩු ආදායම් ලබන්නන් කෙරෙහි වන මිළ වෙනස්වීම් වල බලපෑම සලකා බලනනිසා අඩු ආදායම් ලබන්නන්ගේ සාමාන්‍ය විදුලි පරිභෝජනය මෙම අවම මට්ටමට වඩා අඩු මට්ටමක පවතින බැවින්, මෙම අමතර අයකිරීම, දර්ශකය කෙරෙහි බලපෑමක් ඇති කළේ නැත. ලක්ෂ්‍යමය පදනමක් මත වන වැඩිවීම සලකාබැලූවද 1992 වසරේ දෙසැම්බර් හි දී, මෙම උප දර්ශකයන්හි වූ වැඩිවීම 1991 වර්ෂයේ වූ වැඩිවීමට වඩා අඩු විය.

සාපේක්ෂ වශයෙන් බලන විට 1992 වර්ෂයේදී විවිධ භාණ්ඩ සඳහා වූ උප දර්ශකයෙහි සියයට 15.1 ක විශාල වැඩිවීමක් වාර්තා විය. ලක්ෂ්‍යමය පදනමක් මත සැලකීමේදී, 1991 වර්ෂයේ දෙසැම්බර් මස වූ සියයට 9.7 ක වැඩිවීම හා සසඳා බලන විට 1992 දෙසැම්බර් මස දී මෙම විවිධ භාණ්ඩ අංශයෙහි සියයට 19.5 ක වැඩිවීමක් වාර්තා විය. සුරා බදු වැඩි කරමින් කළ ප්‍රතිශෝධනයත්, ආරක්ෂණ බද්දත් නිසා මෙම අංශයට අයත් වන මත්පැන් සහ දුම්කොළ මිළ ගණන් වල සැලකිය යුතු වැඩිවීමක් වාර්තා විය. බුලත් සහ පුවක් මිළ ගණන් වල වූ සැලකිය යුතු මිළ වැඩිවීම මඟින් දැඩි නියඟයෙන් වූ බලපෑම පැහැදිලි වුනි.


තොග මිළ

1991 වර්ෂයේදී තොග මිළ දර්ශකයෙහි වාර්තා වූ සියයට 9.2 ක වර්ධනය සමඟ සසඳා බලන විට 1992 වර්ෂයේදී එහි සියයට 8.8 ක වැඩිවීමක් වාර්තා වූයෙන් 1992 වර්ෂයේදී ප්‍රාථමික වෙළෙඳපොලෙහි ද මිළ වැඩිවීමේ වර්ධන වේගයෙහි අඩුවීමක් වූ බව පැහැදිලි වේ. කෙසේ වුවද, කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙහි මෙන් නොව තොග මිළ දර්ශකයෙහි පැහැදිලි උපනතියක් දක්නට නොලැබුණි. වසර මුළුල්ලේම දර්ශකයෙහි සුළු උච්චාවචනයන් දක්නට ලැබුණි. ලක්ෂ්‍යමය පදනමක් මත සලකා බලන විට 1992 වසරේ දෙසැම්බර්හි දී තොග මිළ දර්ශකයෙහි සියයට 8.0 ක වැඩිවීමක් වාර්තා විය. මේ සමඟ සසඳන විට පසුගිය වසරේ දෙසැම්බර්වල වූ වැඩිවීම සියයට 8.1 ක සුළු වශයෙන් වූ ඉහළ මට්ටමක තිබුනි.

## වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1978 දෙසැම්බර් = 100

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

**1.36 සංඛ්‍යා සටහන**

**තොග අලෙවි මිල දර්ශකය (1974 - 100)**

| ශීර්ෂය | සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | 1990 දෙසැ. මාසයට වඩා 1991 දෙසැ. වෙනසෙහි ප්‍රතිශතය | 1991 දෙසැ. මාසයට වඩා 1992 දෙසැ. වෙනසෙහි ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1990 වඩා 1991 | 1991 වඩා 1992 | | |
| භාණ්ඩ අනුව | | | | | | |
| සියළුම ශීර්ෂ | 710.8 | 773.0 | 9.2 | 8.8 | 8.1 | 8.0 |
| ආහාර | 649.1 | 720.0 | 8.3 | 10.9 | 9.9 | 8.4 |
| මද්‍යපාන | 776.4 | 886.7 | 16.1 | 14.2 | 14.4 | 18.1 |
| රෙදිපිළි හා පාවහන් | 426.3 | 418.7 | 5.3 | -1.8 | 3.4 | -2.0 |
| කඩදාසි නිෂ්පාදන | 747.4 | 704.9 | 3.4 | -5.7 | -1.7 | -2.8 |
| රසායන හා රසායනික නිෂ්පාදන | 495.4 | 531.0 | 16.9 | 7.2 | 23.2 | 4.6 |
| ඛනිජ තෙල්නිෂ්පාදන | 1105.1 | 1135.7 | 17.8 | 2.8 | - | 5.9 |
| ලෝහ නොවන නිෂ්පාදන | 1262.1 | 1356.0 | 11.6 | 7.4 | 9.4 | 12.6 |
| ලෝහ නිෂ්පාදන | 566.5 | 588.4 | 0.1 | 3.9 | 0.6 | 5.7 |
| ප්‍රවාහන උපකරණ | 568.4 | 623.2 | 12.5 | 9.6 | 6.4 | 13.9 |
| විදුලි උපකරණ හා සැපයීම් | 600.3 | 603.3 | 12.7 | 0.5 | 13.6 | -2.6 |
| යන්ත්‍රෝපකරණ | 409.7 | 440.4 | 9.2 | 7.5 | 7.5 | 10.5 |
| ඉන්ධන හා එළිය | 1289.4 | 1290.5 | 4.5 | 0.1 | 0.1 | - |
| විවිධ | 1214.8 | 1323.2 | 4.1 | 8.9 | 3.4 | 11.0 |
| ආංශික වර්ගීකරණය i | | | | | | |
| දේශීය ගණය | 660.5 | 697.3 | 11.9 | 5.6 | 6.0 | 8.3 |
| ආනයන ගණය | 614.3 | 634.4 | 6.1 | 3.3 | 6.0 | -0.8 |
| අපනයන ගණය | 939.8 | 1109.2 | 7.5 | 18.0 | 13.0 | 13.9 |
| ආංශික වර්ගීකරණය ii | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 688.5 | 760.7 | 9.1 | 10.5 | 9.7 | 8.7 |
| අන්තර් භාණ්ඩ | 781.1 | 807.4 | 9.4 | 3.4 | 3.1 | 4.9 |
| ආයෝජන භාණ්ඩ | 769.3 | 824.9 | 9.8 | 7.2 | 8.4 | 11.7 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1992 වර්ෂයේදී තොග මිළ දර්ශකයේ වැඩිවීම සීමා කිරීම කෙරෙහි රෙදිපිළි, පාවහන් සහ කඩදාසි නිෂ්පාදනවල මිළ ගණන් වල වූ අඩුවීමත්, රසායනික ද්‍රව්‍ය සහ රසායනික නිෂ්පාදනවල සහ ඛනිජ තෙල් නිෂ්පාදනවල මිළ ගණන්හි වූ අඩු වර්ධනයත් හේතු විය. කෙසේ වුවද, 1992 වර්ෂයේදී ආහාර උප මිළ දර්ශකයෙහි වූ වැඩිවීම ඉහළ මට්ටමක පැවතුනි. 1992 වර්ෂයේදී සියයට 8.3 වූ එය 1992 වසරේදී සියයට 10.9 ක් විය. ලෝහ නිෂ්පාදන සහ විවිධ නිෂ්පාදන සඳහා වූ උප දර්ශකයන්හි වර්ධන වේගයන්හිද වැඩිවීමක් වාර්තා වුනි. ආහාර උප දර්ශකයේ වැඩිවීමට විශාල වශයෙන්ම හේතු වූයේ සහල්, පොල්, පොල් තෙල්, එළවළු සහ මාළු මිළ ගණන් වල වූ වැඩිවීමයි. රෙදිපිළි සහ පාවහන් මිළ දර්ශකයේ අඩු වීමට මූලික වශයෙන් හේතු වූයේ අමු කපු වල මිළ ගණන් අඩු වීමයි.

ආංශික වර්ගීකරණය සලකා බලන විට දේශීය කාණ්ඩයෙහි වඩා සැලකිය යුතු වැඩිවීමක් වාර්තා වූ 1991 වර්ෂය මෙන් නොව 1992 වර්ෂයේදී වඩා කැපී පෙනෙන වැඩිවීම වාර්තා වූයේ නිර්යාත කාණ්ඩයෙහිය. නිර්යාත කාණ්ඩයෙහි වැඩිවීම 1992 වර්ෂයේදී සියයට 18 ක් වූ අතර 1991 වර්ෂයේදී එහි වැඩිවීම සියයට 7.5 පමණක් විය. වැඩිවීමට මූලික වූයේ රබර්, පොල් තෙල් සහ ඇතැම් කුළුබඩුවල මිළ ගණන් වැඩි වීමයි. 1991 වර්ෂය සමඟ සසඳා බලන විට 1992 වර්ෂයේදී දේශීය කාණ්ඩය (සියයට 5.6) සහ ආයාත කාණ්ඩය (සියයට 3.3) යන කාණ්ඩ දෙකෙහිම අඩු වර්ධන වේගයන් වාර්තා වුනි. 1991 වසරේදී මෙම කාණ්ඩ වල වූ වැඩිවීම පිළිවෙලින් සියයට 11.9 සහ සියයට 6.1 ක් විය.

අවසන් භාවිතාව අනුව කෙරෙන වර්ගීකරණයට අනුව 1992 වර්ෂයේදී සියයට 10.5 ක ඉහළතම වැඩිවීමක් වාර්තා වූයේ පරිභෝජන භාණ්ඩ උප දර්ශකයෙහිය. මෙම වැඩිවීමට විශාල වශයෙන් හේතු වූයේ ආහාර සහ මද්‍යපාන වල මිළ ගණන් වැඩිවීමයි. 1991 වසරේදී සියයට 9.4 ක් ව පැවති අන්තර් භාණ්ඩ අංශයෙහි මිළ ගණන්වල වර්ධන වේගය 1992 වර්ෂයේදී සියයට 3.4 දක්වා සැලකිය යුතු ලෙස පහළ වැටුනි. 1991 වසරේදී වූ සියයට 9.8 ක වර්ධනය වේගයක් හා සසඳා බලන විට ආයෝජන භාණ්ඩ අංශයෙහි ද වර්ධන වේගය 1992 වර්ෂයේදී සියයට 7.2 දක්වා පහත වැටීමක් වාර්තා වුනි.

වැටුප්

වැටුප් ප්‍රමාණ දර්ශකයට අනුව 1992 වසරේදී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප්වල වූ වර්ධනය 1991 වසරට වඩා අඩු විය. ඇත්තවශයෙන්ම, වැටුප් වල වැඩිවීම මිළ ගණන්වල වූ වැඩිවීම් වලට ප්‍රමාණවත් වන අන්දමට සිදු නොවූයෙන් රාජ්‍ය අංශයේ සියළුම ප්‍රධාන උප අංශවල සේවකයන්ගේ මූර්ත වැටුප්වල පහළ යාමක් වාර්තා වුනි. සංවිධානය වූ පෞද්ගලික අංශයෙහි වැටුප් වැඩිවීම රාජ්‍ය අංශයෙහි සේවකයින්ගේ වැටුප් වැඩිවීමට වඩා ඉහළ මට්ටමක පැවතුනි. පඩිපාලක සභා යටතේ ගැනෙන වෘත්තීන්ට අයත් සේවකයන්ගේ මූර්ත වැටුප් මට්ටමේ සමස්ත වැඩිවීමක් වාර්තා වුනි.

රාජ්‍ය අංශය

1992 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි රු.100 ක විශේෂ දීමනාවක් මූලික ඒකාබද්ධ මාසික වැටුප රු. 3000 ට අඩු, රාජ්‍ය අංශයේ සියළුම සේවකයන්ට ගෙවන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1990 සිට නොවෙනස්ව පැවති රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා වූ වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි සුළු වැඩිවීමක් වාර්තා විය. 1991 වර්ෂයේදී වූ සියයට 12.1 ක වැඩිවීම හා සසඳා බලන කළ 1992 වර්ෂයේදී රාජ්‍ය අංශයේ සියළුම සේවකයන් සඳහා වූ සමස්ත මූල්‍ය වැටුප් සියයට 4.3 කින් වැඩි විය. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් දර්ශකය 1992 වර්ෂයේදී සියයට 6.4 කින් පහළ වැටුන අතර 1991 වර්ෂයේදී එම දර්ශකය නොවෙනස්ව පැවතුනි. රජයේ පාසල් ගුරුවරුන්ගේ මූල්‍ය වැටුප් දර්ශකය 1992 වර්ෂයේදී සියයට 3.8 කින් වැඩි වූ අතර මූර්ත වැටුප් දර්ශකය සියයට 6.8 කින් පහළ වැටුනි. මීට අදාලව 1991 වර්ෂයේදී රජයේ පාසල් ගුරුවරුන්ගේ මූල්‍ය වැටුප් දර්ශකය සියයට 10 කින් වැඩි වූ අතර මූර්ත වැටුප් දර්ශකය සියයට 1.9 කින් පහළ වැටුනි.

රාජ්‍ය අංශයේ සේවකයින්ට අදාල දත්ත උප අංශ වලට වෙන් කළ විට සුළු සේවකයන්ගේ මූල්‍ය වැටුප් වල වැඩිවීම (සියයට 4.7) විධායක නොවන සේවකයින්ගේ වැටුප් වැඩිවීමට (සියයට 3.9) වඩා සුළු වශයෙන් ඉහළ මට්ටමක වූ බව අනාවරණය වේ. මේ අනුව, සුළු සේවකයින්ගේ මූර්ත වැටුප්වල වූ අඩුවීම සියයට 6.0 වුන අතර, ඒ හා සසඳන විට විධායක නොවන සේවකයින්ගේ මූර්ත වැටුප්වල වූ අඩුවීම සියයට 6.7 ක් විය. 1991 වර්ෂයේදී විධායක නොවන සේවකයින්ගේ මූර්ත වැටුප් දර්ශකය සියයට 1.0 කින් පහළ වැටුන අතර සුළු සේවකයින්ගේ මූර්ත වැටුප් දර්ශකය සියයට 1.2 කින් ඉහළ නැගුනි.

### 1.37 සංඛ්‍යා සටහන
### වැටුප් ප්‍රමාණ දර්ශක අංක (1978 දෙසැම්බර් = 100)

| | 1991 | | 1992 | | 1991 ට වඩා 1992 වෙනසෙහි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශක | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශක | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශක | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක |
| 1. රජයේ සේවකයින් | | | | | | |
| i. සියළුම විධායක නොවන නිලධාරීන් | 488.2 | 103.3 | 507.2 | 96.4 | 3.9 | -6.7 |
| ii. සුළු සේවකයින් | 582.3 | 123.3 | 609.9 | 115.9 | 4.7 | -6.0 |
| iii. සියළුම රජයේ සේවකයින් | 534.6 | 113.2 | 557.6 | 106.0 | 4.3 | -6.4 |
| iv. රජයේ පාසල් ගුරුවැන් | 444.8 | 94.2 | 461.8 | 87.8 | 3.8 | -6.8 |
| 2. පඩි පාලක සහා කර්මාන්තයන්හි කම්කරුවන් | | | | | | |
| i. කෘෂිකර්මයේ යෙදී සිටින කම්කරුවන් | 577.7 | 122.2 | 664.0 | 126.1 | 14.9 | 3.2 |
| ii. කර්මාන්ත සහ වාණිජ කටයුතු වල යෙදී සිටින කම්කරුවන් | 459.6 | 97.1 | 510.8 | 97.1 | 11.1 | - |
| iii. සේවා අංශයේ කම්කරුවන් | 336.5 | 71.1 | 365.9 | 69.6 | 8.7 | -2.1 |
| iv. පඩි පාලක සහා කර්මාන්තයන්හි කම්කරුවන් | 518.8 | 109.7 | 590.0 | 112.0 | 13.7 | 2.1 |

මූලය : කම්කරු දෙපාර්තමේන්තුව සහ
ශ්‍රී ලංකා මහ බැංකුව

**සංවිධානය වූ පෞද්ගලික අංශය**

පඩිපාලක සහා යටතට ගැනෙන වෘත්තීන්ගෙන් සමන්විත වූ සංවිධානය වූ පෞද්ගලික අංශයෙහි වෘත්තීන් කිහිපයකටම අදාල අවම වැටුප් 1992 වර්ෂයේදී වැඩි විය. වැඩිවශයෙන්ම මෙලෙස වැටුප් වැඩි වූ ප්‍රධාන වෘත්තීන් වූයේ ඇහලුම් නිෂ්පාදන, ගොඩනැගිලි, පොල් නිෂ්පාදන, ලේඛන කලාව, මුද්‍රණ හා පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනයන් යන අංශයන්ය.

1992 වර්ෂයේදී පඩිපාලක සහා යටතට ගැනෙන සියළුම වෘත්තීන්ගේ මූල්‍ය වැටුප් සමස්ත වශයෙන් සියයට 13.7 කින් වැඩි වූ අතර ඒ හා සසඳන විට 1991 වසරේදී වූ වැඩිවීම සියයට 14.4 ක් විය. 1991 වසරේදී සමස්ත මූර්ත වැටුප් දර්ශකයෙහි වූ සියයට 2.0 ක වැඩිවීම හා සසඳන විට 1992 වසරේදී මිළ මට්ටමෙහි වූ අඩු වර්ධනය හේතුකොට ගෙන එම වසරේ මූර්ත වැටුප් දර්ශකය වැඩිවූයේ සියයට 2.1 කිනි. කෙසේ වුවද, පඩිපාලක සහා යටතට ගැනෙන මූලික කර්මාන්ත අංශවල සැලකිය යුතු අන්දමේ වෙනස්කම් දක්නට ලැබුණි. 1991 වසරේදී කර්මාන්ත සහ වෙළෙඳ අංශවල සේවකන්ගේ සහ සේවා අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්වල වැඩිවීමක් සිදුවූන අතර කෘෂිකාර්මාන්ත අංශයේ සේවකයන්ගේ වැටුප්වල සුළු අඩුවීමක් සිදු විය. එසේ වුවද, 1992 වර්ෂයේදී කෘෂිකාර්මික අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප්වල සියයට 3.2 ක වැඩිවීමක් සිදුවූන අතර, කර්මාන්ත හා වෙළෙඳ අංශවල සේවකයන්ගේ මූර්ත වැටුප් නොවෙනස්ව පැවතුනි. මීට ප්‍රතිවිරුද්ධව 1992 වර්ෂයේදී සේවා අංශයෙහි සේවකයන්ගේ මූර්ත වැටුප්වල සියයට 2.1 ක පහළ වැටීමක් වාර්තා වුනි.

## සේවා නියුක්තිය

තාවකාලික ඇස්තමේන්තු වලට අනුව 1992 වර්ෂයේදී සංවිධානය වූ හා සංවිධානය නොවූ පෞද්ගලික අංශයේ සේවා නියුක්තියෙහි සැලකිය යුතු වර්ධනයක් වූ අතර රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි තවදුරටත් අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ඇස්තමේන්තු කිරීමට පදනම් වී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයෙන් එකතු කරන ලද දත්තයන්ය. රාජ්‍ය අනු අංශයෙහි (රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු) සේවා නියුක්තිය පිළිබඳ මෙම දත්ත මහා භාණ්ඩාගාරයේ වාර්ෂික සේවා නියුක්ති ඇස්තමේන්තු සමඟ ද ගලපන ලදී. තාවකාලික ඇස්තමේන්තු වලට අනුව 1992 වසර අවසානයේ රාජ්‍ය අංශයේ මුළු සේවක සංඛ්‍යාව 1,288,337 ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙය 1991 වසරට වඩා සියයට 1.4 ක අඩුවීමකි. 1991 දී රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිය සියය 3.3 කින් අඩු වුනි. මෙය, තරමක් දුරට, රාජ්‍ය අංශයේ ආයතන පෞද්ගලීකරණය කිරීමේ වැඩපිළිවෙල නිසා සිදුවූවකි. රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන යනාදියෙන් සමන්විත වන රජයේ ආයතන වල සේවා නියුක්තිය 1992 වසර අවසාන වන විට 653,959 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 0.2 ක සුළු වර්ධනයකි. මෙම වර්ධනය වඩාත් පිළිබිඹු වූයේ වෘත්තිය, ශිල්පීය හා සම්බන්ධ සේවකයන් ඇතුලත් වන සේවක කාණ්ඩයෙහි වූ අතර එය විශේෂයෙන් කැපී පෙනුනේ ගුරු වෘත්තියට සම්බන්ධ සේවක සංඛ්‍යාවෙහිය. පසුගිය වසරෙහි දක්නට ලැබුණු උපනතියම පෙන්නුම් කරමින්, රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය විසින් අත්කරගෙන ඇති ව්‍යාපෘති හා රාජ්‍ය අංශයෙහි බැංකු වලින් සමන්විත වන අර්ධ රාජ්‍ය අනු අංශයෙහි සේවා නියුක්තිය ඉකුත් වර්ෂය හා සසඳන විට සියයට 3.1 ක අඩු වීමක් පෙන්නුම් කෙරුණි.

පසුගිය වසර තුළ දී, රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්ත ප්‍රමාණයෙන් සියය 38.3 ක් අයත් වූ රාජ්‍ය අංශයේ විශාලතම සේවා නියුක්ත සංඛ්‍යාවක් ඇති ඊකියා කාණ්ඩය ලෙස සැලකුන, බර වැඩ කම්කරුවන් ඇතුලත් වන සේවා කාණ්ඩයට අයත් සේවක සංඛ්‍යාව 1991 වර්ෂයට වඩා සියයට 1.5 කින් අඩුවී ඇත. වෘත්තීය, ශිල්පීය හා ඊට සම්බන්ධ සේවක සංඛ්‍යාව 1992 වසරේදී 256,526 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර මෙය රාජ්‍ය අංශයේ මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 19.9 ක් විය. මෙම කාණ්ඩයට අයත් සේවක සංඛ්‍යාව 1992 වර්ෂයේදී සියයට 3.1 කින් වර්ධනය වී ඇති අතර ඊට ප්‍රති විරුද්ධව 1991 වර්ෂයේදී එම සේවක සංඛ්‍යාවෙහි සියයට 6 ක අඩුවීමක් වාර්තා වුනි. මෙම කාණ්ඩයට අයත් මුළු සේවා නියුක්ති ප්‍රමාණයෙන් සියයට 68 ක් පාසල් ගුරුවරුන් වන අතර, සියයට 12 ක් සමන්විත වන්නේ වෛද්‍යවරුන්, හෙදියන් සහ සෞඛ්‍ය අංශයට අයත් අනෙකුත් සේවකයන්ගෙනි. වෘත්තිය, ශිල්පීය සහ ඊට සම්බන්ධ සේවක සංඛ්‍යාවෙහි වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1992 වසර තුළ දී ගුරුවරුන්, වෛද්‍යවරුන් හා සෞඛ්‍ය අංශයේ අනෙකුත් සේවකයින් අළුතින් බඳවා ගැනීමයි. රාජ්‍ය අංශයේ ලිපිකරු හා ආශ්‍රිත සේවක සංඛ්‍යාව 1992 වර්ෂයෙහි 198,958 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර පසුගිය වසරට වඩා මෙම කාණ්ඩයේ සේවා නියුක්තිය සියයට 1.8 ක අඩුවීමක් පෙන්නුම් කරයි. සේවා අංශයෙහි නියුක්ත සේවක සංඛ්‍යාව 1992 අවසාන වන විට 243,244 ක් වූ අතර, එය ද සියයට 4 ක අඩුවීමක් පෙන්නුම් කරන ලදී.

පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තිය පිළිබඳව වාර්ෂික දත්ත නොමැති බැවින් එම අංශයෙහි සේවා නියුක්තිය තක්සේරු කිරීමට අර්ථ සාධක අරමුදල් හි ලියාපදිංචි සේවක සංඛ්‍යාව වැනි වෙනත් දර්ශක යොදා ගෙන ඇත. 1990 වර්ෂයේදී 1,267,835 ව පැවති සේවක අර්ථ සාධක අරමුදලේ වූ ක්‍රියාකාරී ගිණුම් සංඛ්‍යාව 1991 වර්ෂය වන විට 1,341,086 දක්වා වැඩි වූ අතර එය සියයට 5 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. 1992 වර්ෂයේදී අනුමත කළ අර්ථ සාධක අරමුදල් හි පෞද්ගලික අංශයේ සේවක සංඛ්‍යාව පසුගිය වසරට වඩා සියයට 10 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. 1992 වර්ෂයේ සංවිධිත පුද්ගලික අංශයේ සේවා නියුක්තිය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ ද, එය පසුගිය වසරේ තරම් ප්‍රශංසා කටයුතු තත්ත්වයක් නොවේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට (කලින් මහ කොළඹ ආර්ථික කොමිසම) අයත් ආයතන වල සේවක සංඛ්‍යාව 1992 වසර තුළ දී තවදුරටත් වැඩි වී වසර අවසන් වන විට 104,220 ක් විය. මෙය පසුගිය වසරට වඩා සියයට 22 ක වැඩි වීමකි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යාපාර වල සේවා නියුක්ත වූවන්ගෙන් සියයට 50 ක් පමණ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයෙහි ක්‍රියාත්මක වන ව්‍යාපෘති 80 ක සේවයෙහි නිරත වූහ. 1991 වසර මැද භාගයේදී වැඩ ආරම්භ කරන ලද කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාප මගින් පුද්ගලයින් 3474 දෙනෙකුට 1992 වර්ෂය තුළ දී රැකියා අවස්ථා ලබා දී ඇත.

රජය මගින් ක්‍රියාත්මක කළ දුගී බව තුරන් කිරීමේ වැඩපිළිවෙල යටතේ බිහි වූ ස්වයං රැකියාවන්, අසංවිධිත පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය තක්සේරු කිරීමට ගතහැකි දර්ශකයකි. ආදායම් උත්පාදන කටයුතු සඳහා වූ විවිධ ණය යෝජනා ක්‍රම යටතේ ණය පහසුකම් සැලසීම, නොකඩවා කෙරුණි. 1992 වර්ෂය අවසාන වන විට පළමු සහ දෙවන අදියර යටතේ වූ ජනසවිලාභීන් 159,224 ක් ආදායම් උපයනු ලබන කටයුතු වල සාර්ථක ලෙස නියැලී ඇති බව වාර්තා වේ.

රටෙහි සේවා වියුක්තිය අඩුකර ගැනීම සඳහා විදේශ රැකියා ද සෑහෙන දුරට උපකාරී වී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් 1992 වර්ෂයේ කරන ලද ගුවන් තොටුපොල සමීක්ෂණයට අනුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ලියාපදිංචි රැකියා ඒජන්තවරුන් මාර්ගයෙන් 1992 වර්ෂයේ දී රැකියා ලබාගත් මුළු සංඛ්‍යාව 124,494 කි. මේ හා සසඳන විට 1991 වසරේදී මෙමගින් රැකියා ලබාගත් සංඛ්‍යාව 65,007 ක් විය. විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ලියාපදිංචි රැකියා ඒජන්තවරුන්ට පිටස්තරව පෞද්ගලික දැන හැඳුනුම් මාර්ගවලින් විශාල සංඛ්‍යාවක් විදේශ රැකියා ලබාගන්නා බැවින්, ඇත්ත වශයෙන් විදේශ රැකියා ලබාගෙන ඇති සංඛ්‍යාව මීට වඩා වැඩිවිය හැක. විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් කරන ලද ගුවන් තොටුපොල සමීක්ෂණයට අනුව ලියාපදිංචි ඒජන්තවරුන් සහ කාර්යාංශය මගින් විදේශ රැකියා සඳහා යන සංඛ්‍යාව මුළු විදේශ රැකියා සංඛ්‍යාවෙන් දළ වශයෙන් අඩක් පමණ වන බව පෙන්නුම් කර ඇත.